| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 11 **ශ්‍රේණිය** | **ඉතිහාසය - II** |

නම/ විභාග අංකය: ......................................... කාලය පැය 3 යි

- **I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **II කොටසේ ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.**

## I කොටස

01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

i. කලා ඔය/ කුඹුක්කන් ඔය / හුරුළු වැව / ඩෙල්ෆ් දූපත / ගම්පොල / මාගම / යෝධ වැව / පල්ලවංක/ ලංකා පටුන / පාහියන්ගල / කැලණිය / ගන්නෝරුව (ලකුණු 12)

ii. මධ්‍යධරණී මුහුද/ කෙරියාව / කැලිකට්/ වැනිසිය / ප්‍රංශය / ලිස්බන් (ලකුණු 6)

(ආ)

(I) I පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදළ පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A- මාඝාත නීතිය පැනවූ රජු නම් කරන්න.

B- ශ්‍රී වික්‍රම රාජසිංහ රජුව ඉංග්‍රීසීන් පිටුවහල් කල ප්‍රදේශය නම් කරන්න.

C- මෙරට නාගරික කම්කරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව හඬක් නැගූ පුද්ගලයා

D- 1956 මහ මැතිවරණයට සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංචමහා බලවේගවල සහාය ලබාගත් දේශපාලනඥයා

(ලකුණු 4)

(II) පහත A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A) 

i. A රූපයෙන් දැක්වෙන රජු නම් කරන්න.

ii. එතුමා අයත්වන රාජධානිය කුමක්ද?

iii. මෙම රූපය අඳින ලද්දේ කවුරුන්ද?

iv. එතුමා මෙරටින් පලවා හැරිය යුරෝපා ජාතිය නම් කරන්න.

(ලකුණු 4)

B) 

i. මෙතුමාගේ නම කුමක්ද?

ii. මෙතුමා කුමන දේශපාලන පක්ෂයේ නායකයා වී ද?

iii. එතුමා හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක්ද?

iv. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඔහු දැරූ තනතුර කුමක්ද?

(ලකුණු 4)

## II කොටස

02)

i. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ සාක්ෂි හමුවන පහතරට තෙත් කලාපීය ගල්ලෙන් තුනක් නම් කරන්න. (ල 3)

ii. පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් කර ගැනීමට පදනම් වූ සාධක දෙකක් නම් කරන්න. (ල 4)

iii. පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණය පිළිබඳ කරුණු දෙකක් සඳහන් කර ඉන් එක් කරුණක් විස්තර කරන්න. (ල 5)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යූහය හා ස්වරූපය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල 6)

03)

i. පහත දක්වා ඇති යෙදුම් භාවිතා කළේ කුමක් හැඳින්වීම සඳහා ද? A, B, C අනුපිළිවෙළින් ලියන්න.

A- වොහාර B- පුගය C- පණ්ණසාලා

(ල 3)

ii. පහත සඳහන් රාජ්‍යත්ව සංකල්ප භාවිතා කළ රජවරු A, B, C, D අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A- නර ඉසෙර B- අලකපය මහරජ

C- චක්‍රවර්තී D- මින්නේරිය දෙවියන්

(ල 4)

iii. ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ දේශීය හා විදේශීය වෙළඳාම පැවති බව කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ල 5)

iv. පැරණි ශ්‍රී ලංකාවේ කර්මාන්ත දියුණු තත්ත්වයක පැවති බවට සාධක ඇත. නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල 6)

04)

i. උඩරට රාජධානියේ නායක්කාර් වංශික රජවරු තිදෙනෙකු නම් කරන්න. (ල 3)

ii. උඩරට රජු විසින් විසඳූ නඩු වර්ග හතරක් සඳහන් කරන්න. (ල 4)

iii. පළමු විමලධර්මසූරිය රජු මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කර ඒවා විසඳා ගත් ආකාරය සඳහන් කරන්න. (ල 5)

iv. මහනුවර රාජධානි සමයේ පැවති ආර්ථික ක්‍රමයේ ස්වභාවය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල 6)

05)

i. දෙවන නාගරීකරණයට අයත් නගර තුනක් නම් කරන්න. (ල 3)

ii. හයවන පරාක්‍රමබාහු රජු ඉටු කළ දේශපාලන සේවාවන් දෙකක් විස්තර කරන්න. (ල 4)

iii. ගම්පොළ රාජධානි සමයේ සිදුවූ විශේෂ සිදුවීම් දෙකක් සඳහන් කර ඒවා පැහැදිලි කරන්න. (ල 5)

iv. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු තුනක් සඳහන් කර පැහැදිලි කරන්න. (ල 6)

06)

i. පහත සඳහන් කාර්යයන් හා සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙළින් නම් කරන්න. (ල 3)

A- වර්ෂ 1908 යටත් විජිත ලේකම්ට විධිමත් පෙත්සමක් ඉදිරිපත් කිරීම.

B- උදයභානු පුවත්පත ආරම්භ කිරීම

C- මධ්‍යසාර භාවිතයෙන් සිදුවන විපත නාට්‍ය මගින් දැනුවත් කිරීම

ii. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල 4)

iii. බ්‍රිතාන්‍ය පාලනය සමයේ මෙරට තේ වගාවේ උන්නතියට බලපෑ හේතු දෙකක් සඳහන් කර විස්තර කරන්න. (ල 5)

iv. බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට සමාජ සේවයේ සිදුවූ යහපත් අංග දෙකක් හා අයහපත් අංගයක් සඳහන් කරන්න. (ල 6)

07)

i. ද්විපක්ෂ ක්‍රමය පවතින රටවල් දෙකක් හා බහු පක්ෂ ක්‍රමය පවතින රටක් නම් කරන්න. (ල 3)

ii. පාර්ලිමේන්තුව සතු බලතල 4ක් සඳහන් කරන්න. (ල 4)

iii. නිදහසට පෙර සහ පසු වී ගොවිතැන දියුණු කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර ඒවා විස්තර කරන්න. (ල 5)

iv. 1978 හඳුන්වා දුන් මැතිවරණ ක්‍රම තුන නම් කර හඳුන්වන්න. (ල 6)

## III **කොටස**

08)

i. පුනරුද සමයේ සිටි මිත්‍ර ශිල්පීන් තිදෙනෙකු නම් කරන්න. (ල 3)

ii. යුරෝපයේ දේශ ගවේෂණ වගින් සොයා ගත් පහත සඳහන් ප්‍රදේශ සොයාගත් දේශ ගවේෂකයන් නම් කරන්න. (ල 4)

A- ඇමරිකාව B- පිලිපීනය

C- කැනඩාව D- කුණාටු තුඩුව

iii. යුරෝපයේ ඇති වූ පුනරුදය ගෝලීය ප්‍රවණතාවක් බවට පත්වූයේ කෙසේදැයි කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල 5)

iv. යුරෝපයේ ඇති වූ පුනරුදයහි බලපෑම ශ්‍රී ලාංකික සමාජයේ පුළුල් වෙනසක් ඇති කිරීමට හේතු විය. මෙය ක්ෂේත්‍ර 3ක් ඔස්සේ උදහරණ දක්වමින් විස්තර කරන්න. (ල 6)


09)


i. එංගලන්තයේ කාර්මික විප්ලවය සිදුවූ ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍ර තුන නම් කරන්න. (ල 3)

ii. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ල 4)

iii. කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ වෙනත් ක්ෂේත්‍රයන් දෙකක් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

iv. කාර්මික විප්ලවය ශ්‍රී ලංකාවට ඇති කළ බලපෑම් උදහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල 6)


N



Africa
Indian Ocean
N